# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 09 ශ්‍රේණිය | ගණිතය | 02 ඒකකය |
|---|---|---|

### වීජ ගණිත තේමාව.

- අඩංගු පාඩම් : 20. ප්‍රස්තාර

### I - කොටස.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන ශ්‍රිතවල දී ඇති එක් එක් x අගයට අනුරූප y හි අගය සොයා එය පටිපාටිගත යුගල ලෙස ලියා දක්වන්න.

   i. $y = 4x$ (x හි අගය -2, -1, 0,1, 2)

   ii. $y = x + 5$ (x හි අගය -8, -7, -6, -5, -4, -3, -2)

   iii. $y = \frac{-2}{3}x + 1$ (x හි අගය -6, -3, 0, 3, 6)

   iv. $y = 1.5x - 4$ (x හි අගය -2, 0, 2, 4, 6)

02. දෙන ලද ශ්‍රිතවල අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය ලියා දක්වන්න.

   i. $y = 2x + 3$  ii. $y = -3x + 5$  iii. $3y = 2x - 6$  iv. $2y - 6x = 7$

03. දෙන ලද අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය අඩංගු ප්‍රස්තාරයේ ශ්‍රිතයේ සමීකරණය ලියා දක්වන්න.

   i. $m = 2$, $C = 3$

   ii. $m = -3$, $C = 5$

   iii. $m = \frac{3}{2}$, $C = 1.5$

   iv. $m = \frac{-5}{3}$, $C = 3$

---

### II - කොටස.

01. $y = \frac{5}{3}x$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා පහත දී ඇති අසම්පූර්ණ වගුව සම්පූර්ණ වගුව සම්පූර්ණ කරන්න.

| x | -6 | -3 |  | 3 | 6 |
|---|---|---|---|---|---|
| y |  | -5 | 0 |  | 10 |

   i. වගුව ඇසුරෙන් ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

   ii. $x = 1$ විට y හි අගය ප්‍රස්තාරය ඇසුරින් ලබාගන්න.

   iii. ප්‍රස්තාරය මත පිහිටි ලක්ෂ්‍ය 3ක ඛණ්ඩාංක ලියන්න.



EXAMRESULTS.LK

02. $y = 3x$, $y = 3x + 1$, $y = 3x - 1$ ප්‍රස්තාර 3ම සුදුසු අගය වගු සකස්කර එකම ඛණ්ඩාංක තලයක අඳින්න.

03. i. $y = -2x + 3$ රේඛාවට සමාන්තර ඕනෑම රේඛා 3ක සමීකරණ ලියා දක්වන්න.

ii. ඒවායේ දළ සටහන් එකම ඛණ්ඩාංක තලයක ඇඳ දක්වන්න.

04. i. $y = 2x + 3$, $y = 2x - 3$, $y = -2x + 3$, $y = -2x - 3$ මඟින් දැක්වෙන රේඛා එකම ඛණ්ඩාංක තලයක ඇඳ දක්වන්න.

ii. ඒවායේ ඡේදන ලක්ෂවල ඛණ්ඩාංක ලියා දක්වන්න.

iii. ලැබෙන රූපය හැඳින්විය හැක්කේ කුමන නමකින්ද?